# ප්ලාස්ටික් හා පොලිතීන්

# භාවිතය අවම කරමු.



ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය
ශ්‍රී ලංකා ජාතික රෝහල
කොළඹ

# ප්ලාස්ටික් හා පොලිතින් යනු කුමක්ද?

ප්ලාස්ටික් හා පොලිතින් යනු කෘතීමව නිෂ්පාදනය වූ ද්‍රව්‍ය වේ. මේවා නිෂ්පාදනයේදී සුවිකාර්යකාරක (Plasticizers), වර්ණක (Colorant), ස්ථායිකාරක (Stabilizer) සහ ලිහිසිතෙල් (Lubricant) වැනි විවිධ රසායනික ද්‍රව්‍ය එක්කරනු ලැබේ.

මේවා ස්වාභාවිකව දිරාපත් නොවන අතර දිරායාම ඉතාමත්ම සෙමින් සිදු වේ. එබැවින් ප්ලාස්ටික් භාවිතය හා අවිධිමත් ලෙස එවැනි අපද්‍රව්‍ය බැහැර කිරීම වර්තමානයේ ශ්‍රී ලංකාව මුහුණ පා ඇති විශාල අර්බුදයකි. එමගින් උග්‍ර පාරිසරික, සෞඛ්‍යමය සහ සාමාජීය ප්‍රශ්න හට ගෙන තිබේ.

තවද මෙම ද්‍රව්‍ය හිරු එළියට නිරාවරණය වීමෙන් බහු අවයවක බන්ධන කැඩී විෂ සහිත රසායනික ද්‍රව්‍ය පරිසරයට එකතු වීමෙන් පරිසරය දූෂණය වේ. උදා:Phthalates, Bisphenol A (BPA)

# විවිධ ප්ලාස්ටික් වර්ග සහ භාවිතය

| | |
|---|---|
| Polyvinylchloride (PVC ) | ආහාර ඇසුරුම්, ළමා සෙල්ලම් බඩු, ඉමල්ෂන් හා මුද්‍රණ තීන්ත |
| Phthalates | වෛද්‍ය උපකරණ |
| Polycarbonate | වතුර බෝතල් |
| Polystyrene | ප්ලාස්ටික් කෝප්ප, |
| Polyethylene | ලන්ච් බොක්ස්, පොලිතින් බෑග්, |
| Polyester | ඇඳුම්, සනීපාරක්ෂක තුවා |
| Urea formaldehyde | ප්ලයිවුඩ්, තාප ආවරණ |
| Polyurethane Foam | කුෂන් කවර, මෙට්ට |
| **Acrylic** | **ගම් වර්ග, කෘතීම දත් ඇදි** |
| **Tetrafluoro-ethelyne** | **nonstick භාජනවල ඇතුළත ආලේපන** |

## වාර්ෂිකව ශ්‍රී ලංකාවේ ප්ලාස්ටික් හා පොලිතීන් භාවිතය

වාර්ෂිකව ආනයනය කරන ප්‍රමාණය 500,000MT




(දත්ත- මධ්‍යම පරිසර අධිකාරිය)

**ශ්‍රී ලංකාවේ දිනකට භාවිතාවන ලන්ච්ෂීට් ප්‍රමාණය (සතියේ දිනවල) මිලියන 15**

**ශ්‍රී ලංකාවේ දිනකට භාවිතාවන සීලී සීලී බෑග් ප්‍රමාණය මිලියන 20**

# පාරිසරික ගැටළු

- කාණු පද්ධති අවහිර වීම නිසා ඩෙංගු වැනි වසංගත තත්ත්ව ඇති වීම
- අවිධිමත් බිම් පිරවීම (**Dumping/ Landfiling**) නිසා කුණු කදු බිහිවීම
- සතුන් කසළ කදු වලින් ආහාර ගැනීම නිසා පොලිතීන් ජීරණ පද්ධතියට එක් වීමෙන් මරණයට පත් වීම
- අපද්‍රව්‍ය බැහැර කිරීමේ බිම් බොහෝ විට ජලාශ ආශ්‍රිතව ඇති නිසා ජල ප්‍රභවයන් දූෂණය වීම
- කසළ කදු ආශ්‍රිතව ඇති ටින් කැබැලි, බැටරි ආදිය නිසා බැර ලෝහ පසට එකතු වීම

## පාරිසරික ගැටළු

- බිම් පිර වීම් වලින් මීතේන් වැනි විෂ වායු පිටවීම නිසා වායු දූෂණය වීම
- මුහුදු ජලයට මිශ්‍ර වීමෙන් මුහුදු ජීවීන් මේවා ආහාරයට ගැනීමෙන් මරණයට පත් වීම
- විවෘත බිම්වල, නිවාස ආශ්‍රිතව පිළිස්සීමෙන් $CO_2$, CO, ඩයොක්සීන සහ ෆියුරාන් වැනි පිළිකාකාරක විෂ වායු වාතයට එක් වීම

## සෞඛ්‍යමය ගැටළු

- ප්ලාස්ටික්/ පොලිතින් පිළිස්සීමෙන් පිටවන විෂ වායූන් නිසා ශ්වසන ආබාධ (ඇදුම, කැස්ස) ඇති වීම
- විවිධ අසාත්මිකතා ඇති වීම
- Polystyrene සහ Styrofoam වැනි ප්ලාස්ටික්වලින් සාදන ලද හැදි, ගෑරුප්පු, පිගන්, කෝප්ප සහ ආහාර ඇසුරුම් කරන පෙට්ටි ආදිය නැවැත නැවැත භාවිතයෙන් විෂ සහිත පිළිකාකාරක රසායනික ද්‍රව්‍ය ශරීරගත වීම

## සෞඛ්‍යමය ගැටළු

- Phthalates රසායනිකය නිසා අන්තරාසර්ග පද්ධතිය ආශ්‍රිත රෝගාබාධවලට ගොදුරු වේ.
- Bisphenol A(BPA) රසායනිකයට දීර්ඝ කාලීනව ගොදුරු වීමෙන්,
  - ❖ ලිංගික ආබාධ
  - ❖ දියවැඩියාව,
  - ❖ තරබාරුකම,
  - ❖ හෘදයාබාධ සහ පිළිකා වැනි රෝගාබාධ ඇතිවිය හැක.



# 2017 සැප්තැම්බර් 01 දින සිට
# තහනම්

පොලිතින් ,Lunch Sheet (ලන්ෂීට්),ෂොපින් බෑග් (සිලි සිලි බෑග්) ඇතුලු HDPE සියලුම මලු හා කවර වර්ග, පොලිස්ටයරින්(රිපිෆෝම්) ලන්ච් බොක්ස් නිෂ්පාදනය,විකිණීම හා භාවිතය

සැකසුම් කළ හා පිසූ ආහාර වර්ග පිරවීම/බහාලීම/ඇසුරුම් කිරීම සඳහා HDPE කවර භාවිතය

පොලිතින් හා ප්ලාස්ටික් අපද්‍රව්‍ය විවෘත ස්ථානවල හා පරිශ්‍රයන් තුළ පිළිස්සීම

ජාතික , සාමාජීය, ආගමික, සංස්කෘතික හා දේශපාලන උත්සව අවස්ථාවලදී කරනු ලබන සැරසිලි සඳහා පොලිතින් භාවිතය

**HDPE- High Density Polyethylene**

# විසඳුම්

- පොලිතින් ඇසුරුම්වලට විකල්ප ලෙස රෙදි, පන් හෝ කඩදාසි, පරිසර හිතකාමී ඇසුරුම් මළු වැනි විකල්ප භාවිතා කරන්න.
- දිරාපත්වන ප්ලාස්ටික් ද්‍රව්‍ය හඳුන්වා දීම සහ ප්‍රචලිත කිරීම



**Tel:** 011-2686143 / 011-2691111 Ext. 2430

**Email :** npdic.nhs@gmail.com

infotoxlanka@gmail.com

https://www.facebook.com/ NTPICSL

https:// twitter .com / PoisonCenterSL

**Web site** http://www.toxbaselanka.info